# මසුරෝ දාන කථා ඇසෙන විට ගැටෙති කෝප වෙති විරුද්ධ වෙති අසතුට පළ කරති

## දුක්කථා සූත්‍රය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අඞ්ගුත්තර නිකාය 3 - පිටු අංක 294 - 299)

මසුරු පුද්ගලයන්ට දාන කථාව ඇසෙන විට ම ඔවුහු කෝපයට පත්වෙති. කිපෙති. ව්‍යාපාදයට පැමිණෙති. විරුද්ධ ව නැගී සිටිති. කෝපය, ද්වේෂය හා අසතුට පහළ කරති.

ඒ කවර හෙයින් ද යත්;

තමා තුළ ඒ දන් දීම නොදකියි. ඒ නිසා ප්‍රීති ප්‍රමෝදය නොලබයි.

එහෙයින් මසුරාට දාන කථා දුක් කථාය.